# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1321 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023 திகதி

දිනය / Date – 19/10/2023 පැය 1630

## මාධ්‍ය නිවේදනය

### 01. වෙඩි තබා තුවාල සිදු කිරීමක් - කිරින්ද පොලිස් වසම.

2023.10.19 වන දින උදෑසන කාලයේ කිරින්ද පොලිස් වසමේ පුස්තෝලමුල්ල ප්‍රදේශයේදී සිදු කරන ලද වෙඩි තැබීමකින් පුද්ගලයෙකු තුවාල ලබා දෙබරවැව රෝහලට ඇතුලත් කර ඇති බවට කිරින්ද පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 50ක් වූ පුස්තෝලමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**
තුවාලකරු නිවසට පැමිණෙමින් සිටියදී පුද්ගලයෙකු විසින් මෙරට නිෂ්පාදිත ගිණි අවියකින් වෙඩි තබා ඇති බවත්, තුවාලකරු වෙඩි තැබීම සිදු කරන ලද පුද්ගලයාගේ බිරිඳ සමඟ පැවති අනියම් සම්බන්ධතාවයක් හේතුවෙන් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බවට දැනට කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.
සැකකරු පලා ගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා කිරින්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මාරක රියඅනතුරක් - නාරම්මල පොලිස් වසම.

2023.10.19 වන අද දින දහවල් කාලයේ නාරම්මල පොලිස් වසමේ නාරම්මල අලව්ව මාර්ගයේ දම්පැලැස්ස පාලම අසල වංගුවේදී අලව්ව දෙස සිට නාරම්මල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මාර්ගයේ ලිස්සා ගොස් බෑවුමකට පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු ඇතුළු බස් රථයේ ගමන් කල මඟීන් 19 දෙනෙකු තුවාල ලබා ඇති අතර ඉන් එක් කාන්තාවක් මිය ගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 51 වූ නාරම්මල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**
තුවාලකරුවන් 07 දෙනෙකු කුරුණෑගල රෝහලේ හා 11 දෙනෙකු නාරම්මල රෝහලේ ප්‍රතිකාර ලබයි. නාරම්මල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**